# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ    அதிவிசேஷமானது    EXTRAORDINARY

අංක 953/9 – 1996 දෙසැම්බර් 10 වැනි අඟහරුවාදා – 1996.12.10
953/9 ஆம் இலக்கம் – 1996 ஆம் ஆண்டு திசெம்பர் மாதம் 10 ஆம் திகதி செவ்வாய்க்கிழமை
No. 953/9 – TUESDAY, DECEMBER 10, 1996

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)    (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)    (Published by Authority)


## IV (අ) වැනි කොටස – පළාත් සභා

### පළාත් සභා නිවේදන

නිවැරදි කිරීමයි

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1993 අංක 03 හා 1995 අංක 07 දරන ප්‍රඥප්ති මගින් සංශෝධිත 1992 අංක 02 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය යටතේ සාදා ප්‍රසිද්ධ කරනු ලබන විධිවිධාන, රීති, නියෝග.

**නියමයන්, විධානයන් සහ නියම කිරීම්**

1996 අගෝස්තු මස 19 වැනි දින අංක 937/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ඉහත සඳහන් ශීර්ෂය යටතේ පළ කරන ලද නිවේදනයට අයත් පස්වන උපලේඛනය – වැරදි සහ දඩ මුදල් යටතේ සඳහන් –

"8. අය කරන මුදලට මගීන්ට ටිකට් පත් නිකුත් කිරීම් රු. 250" යන්න වෙනුවට :

"8. අය කරන මුදලට මගීන්ට ටිකට් පත් නිකුත් නොකිරීම් රු. 250" යන්න ඇතුළත් කිරීමෙන් මෙයින් නිවැරදි කෙරේ.

12–317

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

1996 අංක 03 දරන මධ්‍යම පළාතේ මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1996 අංක 03 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ අංක (1) දරන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍ය වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ පුංචි බණ්ඩා දිසානායක වන මම, මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1996 අංක 03 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය 1997. 01. 01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි මෙයින් නියම කරමි.

ඩබ්ලිව්. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය,
සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා
අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996 දෙසැම්බර් මස 10 වන දින,
මහනුවර දී ය.
12 – 439/1

---

1A – PP 008373 – 1,010 (96/12)

## මධ්‍යම පළාතේ පළාත් සභාව

## මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

**සමහර බදු, බලපත්‍ර ගාස්තු හා වෙනත් ගාස්තු අයකර ගැනීම සහ දණ්ඩනයකට පැනවීම හා එකතු කිරීම සහ ඊට සම්බන්ධ වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.**

මෙම ප්‍රඥප්තිය පහත සඳහන් නීතිවලට අනුකූල වන්නේය :–

1. තෑගි තරග ආඥාපනත ;
2. තුරඟ තරග ආඥාපනත ;
3. රාජ්‍ය ඉඩම් ආඥාපනත ;
4. පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත ;
5. පඩි හා මිමි ආඥාපනත ;
6. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඩු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මෙම ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ 1996 අංක 03 දරන මුදල් (අතිරේක විධිවිධාන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙහි III වන පරිච්ඡේදය හැර, අමාත්‍යවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන දිනයකදී මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක විය යුතුය.

### I වන පරිච්ඡේදය

### තෑගි තරග බද්ද

තෑගි තරග බද්ද.

2. (1) පළාත ඇතුළත ප්‍රවර්ධිත හෝ පවත්වනු ලබන සෑම තෑගි තරගයක් වෙනුවෙන් ම (මෙහි මින් මතු "තෑගි තරග බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයන් මගින් නියම කරනු ලබන යම් අනුප්‍රමාණවලට පනවා අයකර ගත යුතුය.

මෙම ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා, "තෑගි තරග" යන්නෙන් ද්‍රව්‍ය, මුදල් හෝ සේවාවන් ගෙන් තෑගි පිරිනමනු ලබන තරගයක් අදහස් කරන නමුත් ලොතරැයියක් ඊට ඇතුළත් නොවේ.

(2) (අ) පළාත ඇතුළත තෑගි තරගයක් ප්‍රවර්ධනයට හෝ පැවැත්වීමට අදහස් කරන සෑම තැනැත්තෙක් ම ඒ සඳහා මෙයින් සලසා ඇති විධිවිධානවලට අනුව බලපත්‍රයක් ලබාගත යුතුය.

(ආ) පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අදහස් විමසා පහත සඳහන් කාරණා නියම කරනු ලබන නියෝග අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය :-

(i) (2) (අ) ඡේදය යටතේ සඳහන් කරනු ලැබූ බලපත්‍රයෙහි ආකෘතිය හා ඒ සඳහා ගෙවිය යුතු ගාස්තුව;

(ii) මෙම ප්‍රඥප්තිය යටතේ තෑගි තරගයක් ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කළහැකි ස්ථානය හෝ පරිශ්‍රය; සහ

(iii) එවැනි තෑගි තරගයක් ප්‍රවර්ධනය හෝ පැවැත්වීම කරන තැනැත්තා විසින් සැපයිය යුතු වාර්තා.

බද්දෙන් නිදහස් කිරීම.

3. පළාත ඇතුළත පුණ්‍ය කටයුතු, අධ්‍යාපනික හෝ ක්‍රීඩා කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවර්ධිත වූ හෝ පවත්වනු ලැබූ යම් තෑගි තරගයක්, එකහ වනු ලබන යම් කොන්දේසිවලට යටත් ව, මෙම ප්‍රඥප්තිය යටතේ අයකර ගතයුතු යම් බද්දකින් නිදහස් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකිය.

4. මෙම ප්‍රඥප්තිය යටතේ කලින් බලපත්‍රයක් ලබා නොගෙන තැඟි තරගයකට අදාල යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් තබාගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම හෝ ඒ ගැන දතිමින් ම යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් තබා ගැනීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට ඉඩදීම හෝ කුලියට දීම කරනු ලබන යම් තැනැත්තෙක් වරදකට වරදකරු විය යුතුය. මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් දහසකට නොවැඩි දඩයකින් හෝ තුන් මාසයකට නොවැඩි සරල බන්ධනාගාර ගත කිරීමකින් හෝ එකී දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකින් ම හෝ ඔහු දඬුවම් ලැබිය යුතුය.

යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක්, බලපත්‍රයක් රහිතව ලොතරැයියකට හෝ තැඟි තරගයකට යොදා ගැනීම වරදකි.

5. 2(1) වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම **ගැසට් පත්‍රයෙහි** පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් ඒ අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරනු ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවයට ඉන් හානියක් නොවිය යුතුය.

2 වන වගන්තිය යටතේ වූ නියෝගය පළ කිරීමෙන් මසක් ඇතුළත පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

## II වන පරිච්ඡේදය

### ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද

6. (1) පළාත ඇතුළත වූ ස්ථානයක හෝ පරිශ්‍රයක දී මුදලට හෝ ණයට (පළාත තුළ හෝ ඉන් පිටත පැවැත්වෙන) යම් තුරඟ තරගයකදී තබන ලද හෝ පිළිගනු ලැබූ සෑම ඔට්ටුවකින් ම (මෙහි මින් මතු "ඔට්ටු බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක්, අමාත්‍යවරයා විසින් **ගැසට් පත්‍රයෙහි** පළ කරනු ලබන නියෝග මගින් නියම කරනු ලබන අනුප්‍රමාණ අනුව පනවා අයකර ගතයුතුය.

ඔට්ටු ඇල්ලීම වෙනුවෙන් බද්ද.

(2) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම **ගැසට් පත්‍රයෙහි** පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමැතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ඡින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(3) මෙම වගන්තිය යටතේ වූ ඔට්ටු බද්ද ඔට්ටුවක් තැබූ විගසින් ම අයවිය යුතු වන අතර, එවැනි ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන යම් තැනැත්තෙක් එක් එක් ලිත් මාසය සඳහා ගෙවිය යුතු ඔට්ටු බදුවල ඓක්‍යය, එකී ලිත් මාසය ගෙවී දින දහයක් ඇතුළත පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

(4) ඔට්ටු බද්දක් ගෙවීමට යටත් වන යම් තැනැත්තෙක් (3) වන උප වගන්තියෙහි විශේෂිතව දක්වා ඇති පරිදි නියමිත දින දී හෝ ඊට පෙර එම බද්ද ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, එම තැනැත්තා පැහැර හරින්නෙක් ලෙස සැළකිය යුතුය.

(5) යම් ඔට්ටු බද්දක් ගෙවීම් පැහැර හැර ඇති විට, පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැර ඇති මුදලෙන් සියයට දහයකට සමාන මුදලක් ද, ඉන්පසුව එළඹෙන සෑම මාසයක් සඳහා ම සියයට පණහක උපරිමයක් දක්වා සියයට දෙකක අමතර මුදලක් ද, දණ්ඩන විශයෙන් ගෙවිය යුතුය.

(6) (5) වන උප වගන්තියෙහි සඳහන් කළ දණ්ඩනයන් ද ඇතුළුව යම් ඔට්ටු බදු මුදලක් ගෙවීම පැහැර හැර ඇති විට, එය පළාත් සභාවට අයවිය යුතු හිඟ බද්දක් ලෙස සළකා පැහැර හරින්නාගෙන් අයකර ගත හැකිය.

## III වන පරිච්ඡේදය

### ඉඩම් හා ගොඩනැගිලි බද්ද

7. (1) අමාත්‍යවරයා විසින් **ගැසට් පත්‍රයෙහි** පළ කරනු ලබන නියමයක් මගින් එකී නියමයෙහි සඳහන් කරනු ලබන අනුප්‍රමාණයන්ට අනුව හා පාර්ලිමේන්තුව විසින් පනවා ඇති නීතිවලින් අවසර ඇති ප්‍රමාණයට පළාත ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් වෙනුවෙන් පවත්නා ප්‍රාග්ධන අගය අනුව බද්දක් පැනවීම හා අයකර ගැනීම කළ හැකිය.

ඉඩම් හා ගොඩනැගිලි බද්ද.

(1) වන උපවගන්තියෙහි "ඉඩම" යන්නට රජයට අයිති යම් ඉඩමක් ද, "ගොඩනැගිල්ල" යන්නට රජයට අයිති යම් ගොඩනැගිල්ලක් ද ඇතුළත් වේ.

(2) (1) වන උප වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයෙහි පල කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියමයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ජින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගු භාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(3) මෙම වගන්තියෙහි කාර්ය සඳහා "ප්‍රාග්ධන අගය" යන්නෙන් යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් වන විට, එකී ගොඩනැගිල්ලට කරන ලද හෝ සවි කරන ලද වැඩිදියුණු කිරීම්, එකතු කිරීම්, සවි කිරීම් හා සවි කරනු ලද ද්‍රව්‍ය ද එකී ගොඩනැගිල්ල පිහිටා තිබෙන ඉඩමේ මිළ ද ඇතුළුව එකී ගොඩනැගිල්ල ඉදිකිරීමට වැය වූ වියදම ද, යම් හිස් ඉඩමක් සම්බන්ධයෙන් වනවිට, පසුගිය වර්ෂයෙහි දෙසැම්බර් මස 31 වන දිනට එකී ඉඩමෙහි වෙළඳ අගය අදහස් වේ.

(4) මෙම පරිච්ඡේදයෙහි ඇතුළත් විධිවිධාන අමාත්‍යවරයා විසින් ඒ සඳහා නියම කරනු ලබන දිනයක දී ක්‍රියාත්මක විය යුතුය.

## IV වන පරිච්ඡේදය

### ඉඩම් සංවර්ධන ආඥාපනත හා රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු

ඉඩම් සංවර්ධන ආඥාපනත හා රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සඳහා වූ ගාස්තු.

8. පළාත ඇතුළත පිහිටා ඇති යම් ඉඩමක් සඳහා ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රාජ්‍ය ඉඩම් ආඥාපනත යටතේ ගෙවිය යුතු යම් ගාස්තුවක් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ගෙවිය යුතුය.

## V වන පරිච්ඡේදය

### ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද

ඛනිජ අයිතීන් පිළිබඳ බද්ද.

9. (1) පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ යම් තැනැත්තකුට නිකුත් කරන ලද බලපත්‍රයක හෝ අවසර පත්‍රයක බලය යටතේ පළාත ඇතුළත පිහිටි ඉඩමකින් යම් ද්‍රව්‍ය කැණීමේ, සෙවීමේ, ලබාගැනීමේ හෝ ඉවත් කර ගෙන යාමේ අයිතිවාසිකම් ලබා දී, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් නියම කරනු ලබන අනුප්‍රමාණයට හෝ අනුප්‍රමාණයන්ට අනුව වූ, (මෙහි මින්මතු "ඛනිජ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන) බද්දක්, එවැනි තැනැත්තකුට ලබා දී ඇති අයිතිය මත පළාත් සභාවේ යෝජනා සම්මතයක් මගින් පනවා අයකර ගත හැකිය.

(2) (1) වන උප වගන්තිය යටතේ පනවනු ලබන ඛනිජ බද්ද බලපත්‍රයෙන් ලබා දී ඇති අයිතිවාසිකම්වලට හා ව්‍යාපාරයේ පිරිවැටුමට සමානුපාතික විය යුතුය.

(3) (1) වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ මාසයක් ඇතුළත පළාත් සභාවේ අනුමතිය සඳහා එයට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් අනනුමතයේ දිනයේ සිට, පරිච්ජින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කළින් කරන ලද කිසිවක වලංගු භාවයට ඉන් හානියක් නොවිය යුතුය.

## VI පරිච්ඡේදය

### වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වූ ගාස්තු

10. පළාත ඇතුළත වූ යම් ප්‍රදේශයක් සඳහා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ අයකර ගනු ලබන ගාස්තු එම ආඥාපනත යටතේ එම ගාස්තු අයකර ගැනීමට අයිතියක් ඇති බලධරයා විසින් හෝ පළාතෙහි පළාත් අදායම් කොමසාරිස්වරයා විසින් පත්කරන ලද යම් නිලධරයෙකු විසින් අයකර ගත යුතුය. එහෙත් කවර අවස්ථාවක දී වුවද එකී ගාස්තු පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

*වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ ගාස්තු.*

## VII පරිච්ඡේදය

### පඩි හා මිම් ආඥාපනත් යටතේ අය කරනු ලබන ගාස්තු

11. පළාත ඇතුළත පඩි හා මිම් ආඥාපනත යටතේ අයකර ගනු ලබන ක්‍රමවත් කිරීමේ ගාස්තු එම ආඥාපනත යටතේ ඒවා අයකර ගනු ලබන බලධරයා විසින් පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කළ යුතුය.

*පඩි හා මිම් ආඥාපනත යටතේ ක්‍රමවත් කිරීමේ ගාස්තු.*

12. (1) මෙම ප්‍රඥප්තිය 1990 අංක 17 දරන මධ්‍යම පළාතෙහි මුදල් ප්‍රඥප්තියට අතිරේකයක් වශයෙන් සැළකිය යුතු අතර, එකී මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන පරිපාලනය කරන පළාතෙහි පළාත් ආදායම් කොමාරිස්වරයා මෙම ප්‍රඥප්තියෙහි කාර්ය සඳහා ද පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විය යුතුය. පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ඔහුගේ සහායකයින්ට පවරා දෙනු ලබන බලතලවලට අනුව ඔවුන්ට ක්‍රියා කළහැකිය.

*මෙම ප්‍රඥප්තියෙහි සමහර කරුණු සම්බන්ධයෙන් 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියෙහි විධිවිධාන අදාළ විය යුතුය.*

(2) 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තිය යටතේ බදු සහ වෙනත් අයකර ගැනීම් තක්සේරු කිරීමට ද ඒ යටතේ අභියාචනයන්ට ද, එහි සඳහන් කර ඇති වාර්තා හා දණ්ඩනයන්වද අදාළ විධිවිධාන, මෙම ප්‍රඥප්තිය යටතේ ද බදු සහ වෙනත් ගාස්තු තක්සේරු කිරිම, වාර්තා හා දණ්ඩන ආදිය සඳහා ද, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන අතරම, එම ප්‍රඥප්තිය යටතේ පළාතෙහි පළාත් ආදායම් කොමසාරිස්වරයා සතු සියළුම බලතල, එකී යම් කරුණක් සම්බන්ධයෙන්, මෙම ව්‍යවස්ථාවන්හි විශේෂිතව සඳහන් කර නොමැති නම්, මෙම ප්‍රඥප්තිය යටතේ ද ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිය.

## VIII වන පරිච්ඡේදය

### සාමාන්‍ය

13. මෙම ප්‍රඥප්තියෙහි යම් විධානයක් කඩ කරන හෝ ඒ අනුව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම තැනැත්තෙක් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදුකරන් අතර, මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පවත්වනු ලබන සුළු නඩු විභාගයකින් පසුව රුපියල් දහසකට නොවැඩි දඩයකින් හෝ තුන් මාසයකට නොවැඩි සරල බන්ධනාගාර ගත කිරීමකින් හෝ එකී දඩය හා බණ්ඩනාගාර ගත කිරිම යන මේ දෙකින්ම හෝ දඬුවම් ලැබීමකට යටත් වන්නේය.

*වැරදි හා දණ්ඩන.*

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි.-

*අර්ථ නිරූපනය.*

"අමාත්‍යවරයා" යන්නෙන් පළාතෙහි අමාත්‍ය මණ්ඩලයෙහි මුදල් විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ;

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි මධ්‍යම පළාත අදහස් වේ;

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි මධ්‍යම පළාතෙහි පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

ඩබ්. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්,
ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍ය.

1996, දෙසැම්බර් මස 10 වන දින,
මහනුවර දී ය.

12–439/2

---

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

1996 අංක 03 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තිය

**6(1) දරන වගන්තිය යටතේ නියෝගය**

මධ්‍යම පළාත පළාත් සභාවේ 1996 අංක 03 දරන මුදල් (පරිපූරක විධිවිධාන) ප්‍රඥප්තියේ 6(1) දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මධ්‍යම පළාතේ පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය, සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍ය වීරසූරිය දිසානායක මුදියන්සේලාගේ ප්‍රංචිබණ්ඩා දිසානායක වන මම, 1997.01.01 වන දින සිට යම් තුරඟ තරගයකදී තබන ලද හෝ පිළිගනු ලැබූ සෑම ඔට්ටුවක් සඳහා ම සියයට 5ක බද්දක් නියම කරමි.

ඩබ්. එම්. පී. බී. දිසානායක,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය
සහ මුදල්, නීතිය සහ සාමය, ප්‍රාදේශීය පාලනය,
සැලසුම්, ඉඩම්, පළාත් පාලන හා අධ්‍යාපන කටයුතු
පිළිබඳ අමාත්‍ය.

1996 දෙසැම්බර් මස 10 වන දින,
මහනුවර දීය.

12–439/3